**සෞඛ්‍ය අමාත්‍යාංශය**

**දූම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය**

# තනතුරු පුරප්පාඩු - සාමාන්‍යාධිකාරී (HM 1-1)

# ද්විතීක පදනම මත

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දූම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ සාමාන්‍යාධිකාරී තනතුර සඳහා ද්විතීක පදනම මත රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුර සඳහා අයදුම් කිරීමේදී, අයදුම්කරුවන් (ඔහු හෝ ඇය) මෙම තනතුර සඳහා සුදුසුකම් ලදහොත් දැනට සේවයේ නියුතු ස්ථානයෙන් මුදා හැරිය හැකි බවට ස්වකීය අමාත්‍යාංශයේ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සනාථ කර අයදුම්පත එවිය යුතුය.

අයදුම්කරුවන් ස්වකීය සුදුසුකම්, පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු ඇතුළත්ව තමන් විසින් සකස් කරගන්නා ලද ජීව දත්ත පත්‍රිකාවක්, අදාළ අධ්‍යාපන සහ පළපුරුද්ද සහතික කරන ලද සහතික පත්‍රවල පිටපත් සමඟ, **"සභාපති, දූම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය, 11 වන මහල 'ඒ', සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල"** යන ලිපිනයට **2023 / 10 / 24** දින හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපැලෙන් / තමා විසින් ගෙනැවිත් භාරදීම හෝ විද්‍යුත් තැපැලෙන් (විෂය නිරූවෙහි ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කර) එවිය යුතුය. ලියාපදිංචි තැපැල මගින් යොමු කිරීමේදී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

මෙම තනතුරු සඳහා බඳවා ගැනීම / නොගැනීම සම්බන්ධව සියලුම බලතල දූම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සතුය.

| සාමාන්‍යාධිකාරී -තනතුරු 01 (HM 1-1) | |
|---|---|
| අධ්‍යාපන හා වෘත්තීමය සුදුසුකම් | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් වෛද්‍ය, විද්‍යා, කළමනාකරණ හෝ පරිපාලන උපාධියක් ලබා තිබීම.<br>සමග<br>තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තිය ආයතනයක සාමාජිකත්වය ලබා තිබීම.<br>සහ<br>රාජ්‍ය සේවයේ, සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම. |
| වයස් සීමාව | 2023 / 10/ 24 දිනට අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. |
| වැටුප් පරිමාණය | **HM 1-1** තනතුරට අදාළ වැටුප් හා දීමනා හිමිවේ (2016.10.21 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි විධිවිධාන වලට අනුවය) |
| රැකියාවේ ස්වභාවය | ද්විතීක පදනම මත |

**සභාපති**
**දූම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය**
**11 වන මහල "ඒ"**
**සෙත්සිරිපාය දෙවන අදියර**
**බත්තරමුල්ල**
**දු. අං. - 0112187140  ෆැක්ස් - 0112186024**
**විද්‍යුත් තැපැල - natamoh.lk@gmail.com**
**වෙබ් පිටුව - www.nata.gov.lk**
**18/09/2023**